


# ඇය දකින කාන්තා දිනය



අදහස් දැක්වීම:
පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යන අංශයේ
මහාචාර්ය
**දයා අමරසේකර**

මාර්තු 8 වැනිදාට යෙදෙන්නේ ලෝක කාන්තා දිනයයි. කාන්තාවන් ඇගයීමට කාන්තා භූමිකාව පිළිබඳ අවධානය යොමු කිරීමට එක් දිනයක් හෝ ලැබීම පිළිබඳව සෑහීමකට පත් විය හැකිය. එහෙත් සමාජය ඉදිරියේ කාන්තා භූමිකාව දිනයකට සීමා කළ හැකිද? කාන්තාව වෙනුවෙන් දිනයක් ලැබුණත් පුරුෂාධිපත්‍යයෙන් තවමත් තොර නොවූ සමාජයක පිරිමි ඇසින් කාන්තාව දකින්නේ කෙසේද? මේ තවත් දින දෙකකින් උදා වන කාන්තා ඔබේ දිනය වෙනුවෙන් ලියන සටහනකි.

## පරණ මිම්වලින් වර්තමාන කාන්තාව මැනීම වැරදියි

සමාජ ප්‍රගමනයේ ප්‍රධානම සාධකය වෙන්නේ කාන්තාව. මේ ලෝකයේ පැවැත්මට පිරිමින්ට සිදු කළ නොහැකි දායකත්වයක් කාන්තාවගෙන් සිදුවනවා. ඒ වුවත් සමාජය කාන්තාව දකින විදිය, ඇයගේ භූමිකාවට ලබා දෙන වටිනාකම සහ අවධානය එකිනෙකට වෙනස්. මේ වෙනස ප්‍රබල කතා බහකට බඳුන් වෙන්නේ කාන්තාව කාන්තාවක් දිහා බලන ආකාරයට වඩා පිරිමින් කාන්තාව දෙස බලන ඇයව අගයන හෝ විවේචනය කරන ආකාරය අනුවයි. ඒ නිසා වඩා වැදගත් වෙන්නේ කාන්තාව එක් රාමුවකට කොටු කර ඇයව තේරුම් ගැනීමට උත්සාහ කිරීමට වඩා ඇය ජීවත් වන පරිසරය අනුව තේරුම් ගැනීමට උත්සාහ කිරීම තුළයි. උදාහරණයක් වශයෙන් කාන්තාව විෂයෙහි පැන නගින ගැටලු හෝ චේවා සාකච්ඡා හෝ චේවා මේ සියල්ලේ දී යමෙක් වත්මන් කාන්තාවට වඩා අතීත කාන්තාවගේ ගුණ වර්ණනා කිරීමට පෙලඹෙනවා නම් එහි යම් සාධාරණ නොවූ ස්වරූපයක් තිබෙනවා. ඊට හේතුව මේ සමාජ පරිසරවල තිබෙන වෙනස. අතීත සමාජය නොවෙයි අද තිබෙන්නේ. සමාජ ප්‍රගමනයට සාපේක්ෂව අතීත කාන්තාව නොවෙයි අද ඉන්නේ. ඇය සෑම අංගයකින්ම දියුණු වෙලා. හැකියාවලින් පරිපූර්ණ වෙලා. ඒ නිසා පිරිමි ඇසින් කාන්තාවක් දෙස බැලීමේදී පළමුවෙන්ම ඇයව තේරුම් ගත යුතු වන්නේ කෙසේද යන්න බොහෝ දුරට සිතා බැලිය

**වත්මන් සමාජයේදී කාන්තාව ආකාර දෙකකින් සූරා කෑම්වලට ලක් වෙනවා. ඉන් පළමුවැන්න ලිංගික සූරා කෑම්. දෙවැන්න ශ්‍රමය සූරා කෑම. මේ කාරුණු දෙකම අඩු වැඩි වශයෙන් කාන්තාව විෂයේ බල පැවැත්වෙනවා. එයින් ප්‍රබල වශයෙන් කාන්තා ශ්‍රමය සූරා කෑම අදටත් සිදු වනවා.**

යුතුයි. මේ සිතීම තුළ මානුෂිකත්වය, සාධාරණය හා අගය කිරීමේ හැකියාව ගැබ් වී තිබීම අත්‍යවශ්‍ය දෙයක්. අතීත කාන්තා භූමිකාව මැන බලන ප්‍රධාන සාධක වුණේ පවුල් පසුබිම, රැකියාව, විවාහය වැනි කරුණු. එහෙත් අද වනවිට මේ කරුණුවලින් පමණක් කාන්තාව හෝ ඇයගේ භූමිකාව මැනීම එතරම් සාධාරණ නැහැ. ඒ නිසා කාන්තාවක් තේරුම් ගත යුතු බුද්ධිමත්ද ආකාරය වෙන්නේ පළමුව ඇය ජීවත් වන පරිසරය තේරුම් ගැනීම. නමුත් වත්මන් සමාජයේ ඉතා ඛේදනීය තත්ත්වය වෙන්නේ ඇය ජීවත් වන පරිසරයට සාපේක්ෂව ඇයව තේරුම් ගැනීමට වඩා සමාජයෙන්

## රූපයෙන් තොර වටිනාකමක් කාන්තාවන්ට තිබිය යුතුයි

## බටහිර කාන්තාවන් සමග පෙරදිග කාන්තාව සම කරන්න බෑ



## පිරිමින් බොහෝවිට කාන්තාවන්ගෙන් සංවේදීවීම, හෘදයාංගම බව මධ්‍යස්ථවීම අපේක්ෂා කරනවා

## අතීත දැක්මෙන් වර්තමාන කාන්තාව මැනීම සාධාරණ නෑ

කාන්තාව වෙන් කරලා අරගෙන ඇය අදින ඇඳුම් පැළඳුම් හෝ වෙනත් කිසිදු වැඩකට නොමැති දේවලින් ඇය

## වැඩකට නැති දේවලින් කාන්තාව විවේචනය කිරීම වැරදියි

කවුරුන්ද යන්න තේරුම් ගැනීමට උත්සහ කිරීමයි. මෙවැනි නිගමනවලින් බොහෝ විට සිදුවන්නේ කාන්තා අභිවෘද්ධිය නොවෙයි වැරදි සහගත වටහා ගැනීම් නිසා සිදුවන අපහාස සහ අපහසුතා පමණයි.

## පිරිමින් වගේම කාන්තාවන්ගේ දක්ෂතාත් වැඩිවෙලා

අද වන විට සමාජ ශල්‍යතාවය වැඩි වෙලා. සමාජ ශල්‍යතාවය වශයෙන් හඳුන්වන්නේ වේගයෙන් ඉහළට යන, මේ ඉහළ යෑමට සාපේක්ෂව දියුණු වීමේ නොනිත් ආශාවෙන් පසුවන සමාජයක් මේ වන විට ගොඩනැගී තිබීම. මේ සමාජ ශල්‍යතාවය කියන කරුණ සාධනය කර ගන්න අතීත සමාජයේ නම් උරෙනුර සටහනක් ලබා දුන්නේ පිරිමින් පමණයි. නමුත් අද වන විට පිරිමින්ට සාපේක්ෂවම කාන්තාවනුත් මේ කරගකාරීත්වය අතරට පැමිණිලා. එයට හේතුව වෙන්නේ කාන්තාවන් අධ්‍යාපනික වශයෙන් ලබන දියුණුවයි. ඒ බව පාසැල් විශ්ව විද්‍යාල දෙස බැලුවාම ඉතා මැනවින් තේරුම් ගන්න පුළුවන්. මේ වන විට මෙවැනි අධ්‍යාපනික ආයතනවල වැඩි වශයෙන් බාලිකා නියෝජනය වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ තවත් අතකින් කාන්තා නියෝජනය වැඩි වෙලා. කාන්තාවන් ලබන මේ අධ්‍යාපනයත් සමග ඔවුන්ට ජාතික ජාත්‍යන්තර රැකියා අවස්ථාවල දොරගුළු විවර වෙලා. පිරිමින්ට සාපේක්ෂව කාන්තාව තුළද වර්ධනය වෙන ප්‍රබල ශිල්පීය දක්ෂතා නිසා වෘත්තීය ශක්‍යතාවයට වැඩි ඉඩ හසරක් වෙන් වී තිබෙනවා. පිරිමින් කරන රැකියාවලින් බොහෝ ප්‍රමාණයක කාන්තාවනුත් නියැලෙනවා. ඒ නිසා වත්මන් කාන්තා භූමිකාව ඉතාම පුළුලයි සහ සංකීර්ණයි. ගැටලුව පැන නගින්නේ කාන්තා හැකියාව සම්බන්ධයෙන් නොවෙයි. කාන්තාව කාන්තාවක් වීම නිසාම ඉටු කළ යුතු යුතුකම් හා හර පද්ධතීන් මේ නිසා කොතරම් දුරට ඉටු වනවාද යන කාරණාවයි.

## සමාජ අරමුණු ඉටු කරන ප්‍රදර්ශන භාණ්ඩයක්

බොහෝ විට කාන්තාව පිළිබඳ කෙරෙන කතාබහේදී සන්සන්දනාත්මක වශයෙන් ගැනෙන්නේ අතීත සමාජය සහ වත්මන් සමාජය. මේ සන්සන්දනයේදී නම් වත්මන් කාන්තාවගේ යම් පසුබෑමක් පෙනෙනවා. දියුණු යැයි කියන, කාන්තාවට ඉදිරියට යෑමට අවස්ථාව ලබා දෙනවා යැයි කියන මේ සමාජ ක්‍රමයම පදනම් වෙන්නේ මුදල් කියන දේ මත. එහිදී කාන්තා වටිනාකම් සියල්ලත් මුදලට තක්සේරු වෙන අවස්ථා නැතුවාම නොවෙයි. නාවීකරණය වෙන සමාජයේ තිබෙන මූල්‍යමය වටිනාකම් ඉදිරියේ කාන්තාව මේ වන විටත් ප්‍රදර්ශන භාණ්ඩයක් වී හමාරයි. මෙය අතීතයට සාපේක්ෂව වෙනස්ම තත්ත්වයක්. මිනිසුන්ගේ ආර්ථිකයට සම්බන්ධ සියල්ල පිටුපස කාන්තාවට හිමි වෙන්නේ ආර්ථික වටිනාකමක් විතරයි. සිනමාව, මාධ්‍ය, වෙළඳ දැන්වීම් මේ සියල්ල කාන්තාව යොදා ගන්නේ එක්තරා අරමුණක් ඉටු කර ගැනීම වෙනුවෙන් පමණයි. එසේනම් මෙතරම් දියුණු සමාජයේ කාන්තාවනි ඔබට රූපයෙන් තොර වටිනාකමක් හිමි වෙන්නේම නැතිද? එය ගැටලුවක්.

38 වැනි පිටුවට..

**ගයත්‍රි ශෂිකලා විජේසේකර**



03 වැනි පිටුවෙන්..

## පිරිමින් බොහෝවිට..

# අදටත් ප්‍රබල ආකාරයට කාන්තා ශ්‍රමය සූරාකනවා

### සූරා කෑම්වලට ලක්වෙන ප්‍රතිශතය වැඩියි

වත්මන් සමාජයේදී කාන්තාව ආකාර දෙකකින් සූරා කෑම්වලට ලක් වෙනවා. ඉන් පළමුවැන්න ලිංගික සූරා කෑම. දෙවැන්න ශ්‍රමය සූරා කෑම. මේ කරුණු දෙකම අඩු වැඩි වශයෙන් කාන්තාව විෂයේ බල පැවැත්වෙනවා. එයින් ප්‍රබල වශයෙන් කාන්තා ශ්‍රමය සූරා කෑම අදටත් සිදු වනවා. මෙය ළමා ශ්‍රමය සූරා කෑම හා සමානම ගැටලුවක්. ගෘහ සේවිකාවන් ලෙස රට රැකියාවලට යෑම, නුපුහුණු ශ්‍රමිකයන් ලෙස රැකියාවලට යාම, කුලී කම්කරුවන් හා වතු කම්කරුවන් ලෙස රැකියාවල නිරත වීම යන මේ සියල්ලෙන් සිදු වන්නේ කාන්තා ශ්‍රමය සූරා කෑම. කාන්තාවන් රැවටීම. මේවා සියල්ල දක්ෂතා මත පදනම් වන රැකියාවන් නොවේ. ඒ නිසා ශ්‍රමය සූරා කෑමෙන් පමණක් මෙවැනි රැකියා නවතින්නේ නැහැ. කාන්තා ජීවිත දහස් ගණනින් බිලි ගෙන තිබෙන ඉතා ශෝචනීය තත්ත්වයන්ගෙන් කාන්තාව ගිල ගැනීමෙන් අනතුරුවයි මෙවැනි රැකියා හෝ සූරා කෑම් නවතින්නේ. මෙය නූගත් කාන්තාවන්ට පමණක් සිදුවන දෙයක් නොවේ. උගත් කාන්තාවන් පවා කාන්තාවක් වීම නිසා සමාජය ඉදිරියේ යම් යම් අපහසුතාවලට ලක් වෙනවා. ලිංගික අපයෝජනයන්ට කාන්තාවන් ලක් වන්නේ මෙවැනි පරිසරයක් තුළයි.



මේ සියලු දේ නිසා කාන්තාව අද යම්කිසි දුරකට බිඳ වැටීමකට පත්වෙලා තිබෙනවා, ඒ නිසා ඊට විසඳුමක් ලෙස කාන්තාවන් තමන්ටම අනන්‍ය වුණු හුදෙකලා ලෝකයක් ගොඩනගා ගැනීමට තරම් ප්‍රබල වෙලා. මෙය හොඳ තත්ත්වයක් නොවේ. ඇය බිරිඳක් නම් මවක් නම් මෙයින් ඇතිවෙන හානිකර තත්ත්වය මීළඟට සමාජ ප්‍රශ්නයක් දක්වා වුවත් දුරදිග යන්න පුළුවන්. මෙවැනි ගැටලු දුටු සැණින් හැමත කාන්තාවටම වැරදි පටවන්න මේ සමාජය පුරුදු පුරුදු වෙලා ඉන්නවා. නමුත් කළ යුතු වන්නේ එය නොවෙයි. කාන්තාවට සුදුසු ස්ථානය සමාජය විසින් ලබා දීමයි.

## සම තැනද? නිසි තැනද?

කාන්තා සමාජයේ සම තැන සහ නිසි තැන කියන කාරණාව පිළිබඳව ප්‍රබල අරගලයක් තිබෙනවා. වචනවලින් කෙසේ කීවත් භූමිකා වශයෙන් ගැනීමේදී මේ තුළ වෙනස්කම් බහුලව තිබෙනවා.

මේ සංකල්පය පෙරදිග සමාජයට පැමිණෙන්නේම බටහිරින්. ස්ත්‍රීවාදී සංකල්පය පෙරට දමා මේ වෙනුවෙන් විවිධ චින්තන බටහිරින් ඉදිරිපත් කළත් ආසියාතික සමාජයට මෙය ගැළපෙන්නේ නැහැ. තනි තීරණ ගන්න, යාන්ත්‍රීකරණය වුණ ජීවිතයක් ගත කරන අපරදිග කාන්තාව සමග පෙරදිග කාන්තාව කෙසේවත් සම කළ නොහැකියි. අපරදිග කාන්තාව තනි කාන්තාවක් පමණක් නොවෙයි. ඇයට හිමි යුතුකම් වගකීම්, සිරිත් විරිත්, සම්ප්‍රදායන් රාශියක් සමග ඇය බැඳී සිටිනවා. ගැහැනු කම පෙරදිග හා අපරදිග සමාජය දකින ක්‍රමය වෙනස් වෙලා. අවුරුදු ගණනක් තිස්සේ මෙවැනි දේට බටහිර සමාජය හුරු වුවත් පෙරදිගට කාන්තාව තවමත් සුන්දර වස්තුවක්. බටහිර ඉදිරිපත් කරන යාන්ත්‍රීකරණය වුණ කාන්තාව වෙනුවට අපේ සමාජය තවමත් සොයන්නේ ස්ත්‍රී ගතිගුණ නොඅඩුව තිබෙන කැනැත්තියක්. වෙගවත්, තනි තීරණ ගන්න කාන්තාවන් සහිත සමාජයක් දකින්න තවමත් අපේ මනස සකස් වී නැහැ. කෙදිනකවත් සකස් වේ යයි සිතන්නත් අපහසුයි. කාන්තාවට තිබෙන ආවේණික ලක්ෂණ නිසා ඇයට කෙදිනකවත් පුරුෂයන් හා සම තැන ලැබිය නොහැකියි. ඒ බව කාන්තාවන් වටහා ගත යුතුයි. කාන්තාව බිරිඳක් විය යුතුයි. මවක් විය යුතුයි. මේ සෑම අවස්ථාවකදීම ඇය ශාරීරික වශයෙන්, රූපයෙන්, ඇඳුම් පැළඳුම්වලින් වෙනස් වීම්වලට බඳුන් වනවා. මේ සියල්ල සමගයි කාන්තාවන්ගේ රැකියා, හැකියා, කුසලතා රැඳී තිබෙන්නේ. මේ සියලු තත්ත්වයන් යටතේ පිරිමියෙක් කරන සියලු දේ කාන්තාවකට පමණක් ස්ව ශක්තියෙන් කළ නොහැකියි. නමුත් ඉතා පැහැදිලිව කාන්තාවකට නිසි තැන ලබා දීමට සමාජයීය වශයෙන් කටයුතු කළ හැකියි වගේම නිවසේ දීත් කාන්තාවට නිසි තැන ලබා දීමට සැමියාට හා දරුවන්ට හැකියාව තිබෙනවා. ඒ නිසා කාන්තාවනි සම තැන වෙනුවට නිසි තැන ලබා ගන්න. ඒ තුළ ඔබට හිමි වටිනාකම නොඅනුමානවම ලැබේවි.

## ඉතිරි වන්නේ හුදෙකලාවක් පමණයි

කාන්තාව හා පුරුෂයන් අතර තිබෙන සමාජ තත්ත්වය පිළිබඳ ගැටුමේදී කාන්තාව පුරුෂයන් යටතට පත් වන සීමාව වැඩියි. ඊට එක් හේතුවක් වන්නේ තවමත් සමාජයේ තිබෙන පුරුෂවාදී ආකල්ප. බිරිඳක් විදියට ඇය සැමියා යටතට පත් වෙනවා පමණක් නොවේ දරුවන් විසිනුත් මව හුදෙකලා කිරීම සිදුවනවා. පරිගණක, ජංගම දුරකථන වගේ තාක්ෂණික උපාංග වගේම දරුවන්ගේ අධ්‍යාපන රටාවල තිබෙන දියුණුවත් මීට බලපානවා. දරුවන් ඉගෙන ගන්න තාක්ෂණික විෂයන්, භාෂා නොදැනීම නිසා දරුවන්ගේ ලෝකයෙන් මව ඈත් වෙනවා. අවසානයේ දරුවන් හොඳින් ඉගෙන ගෙන රටින් පිටව ගිය පසු ඇයට අවශ්‍ය ආදරය රැකවරණය කෙසේවත් ලැබෙන්නේ නැහැ. ඉතිරි වන්නේ හුදෙකලාවක් පමණයි.

මේ කුමක් වුවත් කාන්තාවකගෙන් පිරිමින් දකින්නට උත්සාහ කරන්නේ කාන්තාවක් ලෙස තිබිය යුතු සංවේදී බව, හෘදයාංගම බව, ගැටලු ප්‍රශ්න හමුවේ තාර්කික වීම වෙනුවට මධ්‍යස්ථ වීම, පුළුල්ව ගැටලුවක් දෙස බලා බුද්ධිමත්ව විසඳා ගැනීම. එළඹෙන කාන්තා දිනය වෙනුවෙන් ඔබට ලබා දිය හැකි පණිවිඩයත් එයයි.